# පරිච්ඡේදය 05

# මූල්‍ය සැලැස්ම

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

5.1 මූල්‍ය සැලැස්ම හැඳින්වීම

5.2 ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර කාර්යයන් සහ වියදම්

5.3 මුළු ආයෝජන ඇස්තමේන්තුව

5.4 අපේක්ෂිත මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් පිළිබඳ ලේඛනය

5.5 ව්‍යාපාර ප්‍රතිඵල ගණනය

X සමස්ත ව්‍යාපාර සැලැස්ම



## 5.1 මූල්‍ය සැලැස්ම හැඳින්වීම

පසුගිය පරිච්ඡේදවල දී ව්‍යාපාර සැලැස්මක අඩංගු විය යුතු අලෙවි, නිෂ්පාදන සහ පරිපාලන සැලැස්ම පිළිබඳ ව ඔබ අධ්‍යයනය කර ඇත. මෙම පරිච්ඡේදයේ දී ව්‍යාපාර සැලැස්මක අවසාන හා වැදගත් ම වූ කොටසක් වන මූල්‍ය සැලැස්ම පිළිබඳ ව විස්තර කෙරේ. අපේක්ෂිත ව්‍යපාරයේ ආයෝජනය සඳහා වූ මූල්‍ය අවශ්‍යතා සහ ව්‍යාපාරයේ ලාභදායිත්වය පුරෝකථනය කර දක්වන්නේ මූල්‍ය සැලැස්ම නම් කොටසිනි.

මූල්‍ය සැලසුම මගින් අපේක්ෂිත ව්‍යාපාරය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල් ද, ව්‍යාපාරය තුළට ගලා එන මුදල් හා ව්‍යාපාරයෙන් පිටතට ගලා යන මුදල් ද, දෛනික ව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වියදම් ද ඇස්තමේන්තු කෙරේ. එමෙන්ම නිශ්චිත කාලයක් තුළ ව්‍යාපාරයේ පුරෝකථනය කළ ආදායම හා වියදම සැලකිල්ලට ගෙන, ලැබේ යැයි අපේක්ෂිත ලාභය ද මෙහි පෙන්නුම් කෙරේ.

**මූල්‍ය සැලසුමක් මගින් ව්‍යවසායකයාට පහත දැක්වෙන ප්‍රයෝජන ලැබේ.**

P ව්‍යාපාරයට අවශ්‍යවන අරමුදල් ප්‍රමාණය නිගමනය කර ගැනීමට
P මූල්‍ය ගැටලු අවම කර ගැනීමට
P නිශ්චිත කාලච්ඡේදයක් අවසානයේ ව්‍යාපාරය ලබන ප්‍රතිඵලය එනම් ලාභය දැන ගැනීමට
P එම ප්‍රතිඵලය ප්‍රමාණවත් ද යන්න ඇගයීමට

මූල්‍ය සැලැස්මක අන්තර්ගත කොටස් පහත දැක්වේ.

P ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර කාර්යයන් හා වියදම්
P මුළු ආයෝජන ඇස්තමේන්තුව
P අපේක්ෂිත මුදල් ගලා යාම් සහ මුදල් ගලා ඒම් ලේඛනය
P ව්‍යාපාර ප්‍රතිඵල ගණනය

මෙම එක් එක් කොටස් පිළිබඳ ව කෙටියෙන් විමසා බලමු.

## 5.2 ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර කාර්යයන් හා වියදම්

ඕනෑම කාර්යයක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා සම්පූර්ණ කළ යුතු කාර්යයන් සහ දැරිය යුතු වියදම් පවතී. එමෙන්ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ද ව්‍යවසායකයා කළ යුතු කාර්යයන් හා ඒවා සඳහා දැරිය යුතු වියදම් ද වේ. එවැනි කාර්යයන් සහ වියදම් කිහිපයක් පහත දැක්වේ.

### වෙළෙඳපළ සමීක්ෂණ වියදම්

නව ව්‍යාපාර කටයුත්තකට එළඹීමට ප්‍රථම ව කෙරෙන මූලික කටයුත්තක් නම් එම ව්‍යාපාරය සම්බන්ධ ව වෙළෙඳපළ අධ්‍යයනය කිරීමයි. එයට අපි වෙළෙඳපළ සමීක්ෂණය යැයි කියමු. එසේ අපේක්ෂිත ව්‍යාපාර කටයුත්ත සම්බන්ධ ව අවශ්‍ය තොරතුරු එක් රැස් කර ගැනීම, ඒවා විශ්ලේෂණය කර ගැනීම හා වාර්තා සකසා ගැනීම ආදී කටයුතු වෙනුවෙන් දරන වියදම් මීට අයත් වේ.

**නිදසුන් :-**

පාරිභෝගික අවශ්‍යතා හා තරගකරුවන්, භාණ්ඩ හා සේවා බෙද හරින ආකාරය සහ භාණ්ඩය හෝ සේවාව විකිණිය හැකි මිල ගණන් ආදී කරුණු පිළිබඳ ව අධ්‍යයනය කිරීම සඳහා වන වියදම්

### ස්ථානය සංවර්ධනය සඳහා වන වියදම්

ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර ව්‍යාපාර පරිශ්‍රය ඊට අවශ්‍ය වන ලෙස සකසා ගත යුතු ය. ඒ සඳහා දැරීමට සිදුවන වියදම් මීට අයත් වේ.

**නිදසුන් :-**

විදුලිය, භූමිය සැකසීම, ජල පහසුකම්, අන්තර්ජාල පහසුකම්, දුරකථන ජාල පහසුකම් ස්ථාපනය සඳහා වන වියදම් සහ පරිශ්‍රය සකස් කිරීම සහ පිරිසිදු කිරීම ආදිය සඳහා වන වියදම්



රූපය 5.1

### අමු ද්‍රව්‍ය හා උපකරණ සොයා බැලීම සඳහා වන වියදම්

ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ව්‍යාපාර කටයුතුවලට අවශ්‍ය වන උපකරණ ලබාගෙන ස්ථාපිත කරගත යුතු ය. එසේම නිෂ්පාදන කටයුත්තක දී නම් ලාභදයි ව අමු ද්‍රව්‍ය, උපකරණ ආදී සැපයුම් සේවා ලබාගත හැකි ක්‍රම හා ආයතන ආදිය පිළිබඳ ව්‍යවසායකයා තොරතුරු සපයාගත යුතු ය. ඒවා සපයන ආයතන, මිල ගණන්, ආදිය පිළිබඳ තොරතුරු සොයා ගැනීම සඳහා දරන වියදම් මීට අයත් වේ.

**නිදසුන් :-**

සැපයුම්කරුවන් වෙත ගොස් ද්‍රව්‍ය හා උපකරණ පරීක්ෂා කිරීමට යන වියදම්, ලිපි ලේඛන හුවමාරු වීමේ වියදම්, සාම්පල පරීක්ෂාව ආදිය සඳහා වන වියදම්

### ලියාපදිංචි කිරීම සඳහා වන වියදම්

ව්‍යාපාරයක් ආරම්භ කරන විට අදාළ බලය ලත් ආයතනවල ලියාපදිංචි විය යුතු ය. තව ද ඇතැම් ව්‍යාපාර කටයුතු සඳහා සුවිශේෂී අනුමැතිය හෝ බලපත්‍ර ලබා ගත යුතු ය.

**නිදසුන් :-**

කළුගල් කැඩීම සම්බන්ධ ව්‍යාපාරයක් ආරම්භ කරන විට දී පහත දැක්වෙන ආයතනවලින් විශේෂ බලපත්‍ර ලබාගත යුතු වීම

ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය

මේ ආකාරයට ව්‍යාපාරයේ ලියාපදිංචියට හා විශේෂ බලපත්‍ර ලබා ගැනීම සඳහා වන වියදම් මීට අයත් වේ.

### වෙනත් වියදම්

ව්‍යාපාර ආරම්භ කිරීම වෙනුවෙන් දැරීමට සිදුවන ඉහත සඳහන් නොවූ අනකුත් සියලුම වියදම් මේ ගණයට අයත් වේ.

**නිදසුන් :-**

නෛතික කටයුතු සඳහා යන වියදම්, ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමට යන වියදම්, ආරම්භක දින උත්සව වියදම් ආදිය



*රූපය 5.2*



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



### ක්‍රියාකාරකම 01

නව ව්‍යාපාරයක් ආරම්භ කළ 'ප්‍රතිභා' ව්‍යාපාරයේ වියදම් කිහිපයක් පහත දැක්වේ. ඒවා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර වියදම් යටතට ගැනේ නම් ✓ ලකුණ ද එසේ නොවේ නම් ✗ ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.

| අනු අංකය | වියදම | ✓ / ✗ |
|---|---|---|
| 01 | වෙළෙඳපළ සමීක්ෂණ සඳහා ABC සමාගමට රු. 25 000 ක් ගෙව්වා | |
| 02 | කාර්යාලයට ලී බඩු මිල දී ගත්තා රු. 60 000 | |
| 03 | බලපත්‍ර සඳහා ප්‍රාදේශීය සභාවට ගෙව්වා රු. 1 500 | |
| 04 | ගොඩනැගිලි පිරිසිදු කිරීමට ගෙව්වා රු. 5 000 | |
| 05 | විදුලි සැපයුම ලබා ගැනීම සඳහා පරිශ්‍රය සකස් කර ගැනීමට රු. 4 000 | |
| 06 | පරිගණක ජාලයේ රැහැන් ඇදීමේ ගාස්තුව රු. 8 000 | |
| 07 | පරිගණක යන්ත්‍ර 10ක් මිල දී ගත්තා රු. 800 000 | |
| 08 | ව්‍යාපාර සැලැස්ම සැකසීම වෙනුවෙන් ගෙව්වා රු. 20 000 | |
| 09 | ව්‍යාපාර ආරම්භක දිනයේ සංග්‍රහ වියදම් රු. 8 500 | |
| 10 | සැපයුම්කරුවන් සමග තොරතුරු හුවමාරු කරගැනීම සඳහා වූ වියදම් රු. 1 000 | |

## 5.3 මුළු ආයෝජන ඇස්තමේන්තුව

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යවසායකයාට යෝජිත ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා කොපමණ මුදලක් ආයෝජනය කළ යුතු දැයි කල් තබා දැන ගැනීම ඉතාමත් වැදගත් වේ. මුළු ආයෝජන ඇස්තමේන්තුව එම අවශ්‍යතාව උදෙසා සකස් කරනු ලබන කොටසකි. ඇතැම් විටක මෙය 'ව්‍යාපෘති පිරිවැය' ලෙස ද හඳුන්වනු ලැබේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## මූළු ආයෝජන ඇස්තමේන්තුවක අන්තර්ගතය

ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූළු ආයෝජන ඇස්තමේන්තුව පහත සඳහන් කොටස්වලින් සමන්විත ය.

- ස්ථාවර වත්කම්වල වටිනාකම
- ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරිය යුතු වියදම්
- ව්‍යාපාර කටයුතු දෛනික ව පවත්වාගෙන යාමට අවශ්‍ය වන මූලික අරමුදල (කාරක ප්‍රාග්ධනය)

### ස්ථාවර වත්කම්වල වටිනාකම

ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ, රථවාහන, ලීබඩු ආදී වත්කම් අවශ්‍ය වේ. මෙවැනි වත්කම් ව්‍යාපාර වෙනුවෙන් වර්ෂ කිහිපයක් භාවිත කළ හැකි වේ. මෙහිදී ව්‍යාපාරයේ ස්ථාවර වත්කම් ලෙස සලකා බැලෙන්නේ මීට පෙර දැක්වූ නිෂ්පාදන, අලෙවි හා පරිපාලන සැලසුම්වල ඇතුළත් කළ සියලු ස්ථාවර වත්කම් සහ ඒවායේ වටිනාකම් ය.

### ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරිය යුතු වියදම්

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ප්‍රථම දැරිය යුතු වියදම් මොනවා දැයි 5.2 කොටසින් අධ්‍යයනය කර ඇත. මූළු ආයෝජන ඇස්තමේන්තුව සැකසීමේ දී එම වියදම් සියල්ල අදාළ කර ගැනේ.

### ව්‍යාපාර කටයුතු දෛනික ව පවත්වාගෙන යාමට අවශ්‍ය වන වියදම

ව්‍යාපාරයේ කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් මුදලක් ව්‍යාපාරය ආරම්භක අවස්ථාවේ සිට ව්‍යවසායකයා සතු ව පැවතිය යුතු ය. මෙසේ එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණය කාරක ප්‍රාග්ධනය යන නමින් ද හඳුන්වයි.

ව්‍යාපාරයකට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය තීරණය කිරීමේ දී ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කර ව්‍යාපාරයට මුදල් ගලා එන තෙක් ගතවන කාලයට අවශ්‍ය වන නිෂ්පාදන වියදම්, අලෙවිකරණ වියදම් සහ පරිපාලන වියදම් ගණනය කරගත යුතු වේ.

එනම්, එම කාලයට අදාළ අමු ද්‍රව්‍ය, සේවක වැටුප්, ජලය, විදුලිය, දුරකථන, ප්‍රචාරණ, බෙදා හැරීමේ වියදම්, බදු කුලිය, පොලී ආදී සියලු වියදම් ගණනය කරගත යුතු වේ.

ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය ඌණ ව හෝ අතිරික්ත ව පවත්වාගෙන යාම අහිතකර වේ. අවශ්‍ය තරම් කාරක ප්‍රාග්ධනය නොමැති වුවහොත් දෛනික ව්‍යාපාර කටයුතු සුමට ව හා අඛණ්ඩ ව කරගෙන යාමට බාධා ඇති වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**නිදසුන් :-**

අමුද්‍රව්‍ය නිසි වේලාවට මිල දී ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රමාණවත් නොවුවහොත් එදිනෙද නිෂ්පාදන කටයුතු සිදු කිරීමට නොහැකි වන අතර සියලු ව්‍යාපාරික කටයුතු ඇණ හිටීම හා ප්‍රමාද වීම මගින් ව්‍යාපාරයට අලාභ ඇති වීම

කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවට වඩා වැඩිපුර මුදලක් ළඟ තබා ගැනීමෙන් ඇතිවන අවදානම හා වෙනත් ආයෝජනයක යොදවා ලබාගත හැකි ආදායමක් නොලැබී යාම

ඌන කාරක ප්‍රාග්ධන අවස්ථාවකදී යම් අවශ්‍යතාවක් සඳහා ක්ෂණික ව මුදල් සම්පාදනය කර ගැනීමේ දී වැඩි පොලියක් ගෙවීමට හෝ අවාසි සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වීම

ස්ථාවර වත්කම්වල වටිනාකම, ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරිය යුතු වියදම් සහ ව්‍යාපාර කටයුතු දෛනික ව පවත්වාගෙන යාමට අවශ්‍ය වන වියදම් සඳහා කළ යුතු ආයෝජන මුදල තීරණය කළ පසු ඒවා සම්පාදනය කරගනු ලබන්නේ අයිතිකරුවන්ගේ මුදලින් ද බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගත් මුදලින් ද යන්න තීරණය කළ යුතු ය.

**පහත දැක්වෙන අභ්‍යාසය මගින් මුළු ආයෝජන ඇස්තමේන්තුවක් පිළියෙල කරන්නේ කෙසේද යන්න අධ්‍යයනය කරන්න.**

*සරත් සිරිවර්ධන මහතාගේ 'වර්ධන' අභ්‍යාස පොත් ව්‍යාපාරය වෙනුවෙන් සැකසූ ව්‍යාපාර සැලැස්මේ තොරතුරු පහත දැක්වේ.*

| වියදම් ඇස්තමේන්තු | රු. |
|---|---|
| කඩදාසි කපන යන්ත්‍රය මිල දී ගැනීම | 150 000 |
| ලියාපදිංචි ගාස්තුව | 1 500 |
| විදුලි සබඳතාව ලබා ගැනීමට අවශ්‍ය පරිශ්‍රය සැකසීම | 25 000 |
| කාර්යාලීය ලී බඩු සඳහා | 80 000 |
| කාර්යාලයට පරිගණකයක් මිල දී ගැනීම | 65 000 |
| අලෙවි රථයක් මිල දී ගැනීම | 1 500 000 |
| ෆැක්ස් යන්ත්‍රයක් මිල දී ගැනීම | 15 000 |
| ව්‍යාපාර සැලසුම සැකසීමේ වියදම් | 22 000 |
| සමාරම්භක දිනයේ උත්සව වියදම් | 15 200 |
| වෙළෙඳපළ සමීක්ෂණ වියදම් | 18 000 |

නිෂ්පාදන ආයතනය ලෙස භාවිත කිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ල සරත් සිරිවර්ධන මහතාට අයත් වන අතර එහි වටිනාකම රු. 2 000 000කි.

අලෙවි රථය මිල දී ගැනීමට රු. 1 000 000ක බැංකු ණයක් ලබා ගැනීමට යෝජිත ය.

තව ද ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා සති 02ක කාලයක වියදම්වලට ගැළපෙන මුදලක් අවශ්‍ය බව තක්සේරු කොට ඇති අතර එම ප්‍රමාණය රු. 350 000ක් පමණ වේ.

"වර්ධන" අභ්‍යාස පොත් ව්‍යාපාරය
මුළු ආයෝජන ඇස්තමේන්තුව

| | යෝජිත ආයෝජනය | | මුළු ආයෝජනය රු. |
|---|---|---|---|
| | අයිතිකරු යොදවන රු. | බැංකු ණය රු. | |
| **ස්ථාවර වත්කම්** | | | |
| ගොඩනැගිල්ල | 2 000 000 | | 2 000 000 |
| අලෙවි රථය | 500 000 | 1 000 000 | 1 500 000 |
| කාර්යාලීය ලී බඩු | 80 000 | - | 80 000 |
| පරිගණක යන්ත්‍රය | 65 000 | - | 65 000 |
| ෆැක්ස් යන්ත්‍රය | 15 000 | - | 15 000 |
| කඩදාසි කපන යන්ත්‍රය | 150 000 | | 150 000 |
| A. මුළු ස්ථාවර වත්කම් | 2 810 000 | 1 000 000 | 3 810 000 |
| **ආරම්භ කිරීමට පෙර වියදම්** | | | |
| වෙළෙඳපළ සමීක්ෂණ වියදම් | 18 000 | - | 18 000 |
| ලියාපදිංචි ගාස්තු | 1 500 | - | 1 500 |
| විදුලි සබඳතාව ලබා ගැනීම | 25 000 | - | 25 000 |
| ව්‍යාපාර සැලසුම් සැකසීම | 22 000 | - | 22 000 |
| සමාරම්භක උත්සව වියදම | 15 200 | - | 15 200 |
| B. ආරම්භ කිරීමට පෙර වියදම් | 81 700 | - | 81 700 |
| **කාරක ප්‍රාග්ධනය** | | | |
| දෛනික ව්‍යාපාර කටයුතු සඳහා | 350 000 | | 350 000 |
| C. මුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව | 350 000 | - | 350 000 |
| මුළු ආයෝජනය (A+B+C) | 3 241 700 | 1 000 000 | 4 241 700 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මේ අනුව සරත් සිරිවර්ධන මහතාට ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය මුළු අරමුදල රු. 4 241 700 වන අතර ඉන් රු. 1 000 000ක් බැංකු ණයක් ලෙස ලබා ගැනීමටත් රු. 2 000 000ක් වටිනා අයිතිකරුගේ ගොඩනැගිල්ල ව්‍යාපාරයට යෙදවීමටත් රු. 1 241 700 මුදල ඔහුගේ පෞද්ගලික මුදලින් යෙදවීමටත් නියමිත ය.



### ක්‍රියාකාරකම 02

පහත දැක්වෙන්නේ මොහොමඩ් ඉත්තිකාර් මහතා ආරම්භ කිරීමට යෝජිත ඇඟලුම් නිෂ්පාදන ව්‍යාපාරය සම්බන්ධ තොරතුරු කිහිපයකි. ඒ ඇසුරින් 'ඉත්තිකාර් ගාමන්ට්ස්' ආයතනය සඳහා වූ ව්‍යාපාර සැලැස්මේ මුළු ආයෝජන සැලැස්ම සකස් කරන්න.

| අයිතමය | වියදම රු. |
|---|---|
| මහන මැෂින් 10ක් මිල දී ගැනීමට | 400 000 |
| ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීමට | 25 000 |
| දුරකථන සබඳතාව ලබා ගැනීමට | 23 000 |
| කාර්යාලීය උපකරණ ලබා ගැනීමට | 63 000 |
| වෙළෙඳපළ සමීක්ෂණ වියදම් | 4 500 |
| රෙදි කපන යන්ත්‍රයක් මිල දී ගැනීමට | 200 000 |
| ජල පහසුකම ස්ථාපිත කර ගැනීමට | 11 000 |
| ව්‍යාපාර සැලසුම සකසා ගැනීමට | 15 000 |

ව්‍යාපාර ස්ථානය සඳහා මොහොමඩ් මහතා සතු රු. 1 800 000ක් වටිනා ගොඩනැගිල්ල භාවිත කිරීමට අපේක්ෂිත ය.

තව ද දැනටමත් ඔහු සතු රු. 200 000ක් වටිනා මහන මැෂින් 05ක් ද ව්‍යාපාරයට යෙදවීමට අදහස් කරයි.

මහන මැෂින් 10ක් මිල දී ගැනීමට හා රෙදි කපන යන්ත්‍රයක් මිල දී ගැනීමට රු. 600 000ක බැංකු ණයක් ගැනීමට ද අපේක්ෂා කරයි.

දෛනික ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට අවශ්‍ය අත තිබිය යුතු මුදල රු. 400 000කි.

## 5.4 ඇස්තමේන්තුගත මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් පිළිබඳ ලේඛනය

යම් අනාගත නිශ්චිත කාලඡේදයක් තුළ යෝජිත ව්‍යාපාරයට මුදල් ගලා ඒම් හා ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගලා යාම් ඇතුළත් කර සකසන ලේඛනයයයි. මෙම ලේඛනය සැකසීමෙන් යම් නිශ්චිත කාලඡේදයක් අවසානයේ ව්‍යාපාරයේ ඇති මුදල් ප්‍රමාණය ගණනය කරගත හැකි වේ. මෙමගින් අනාගත නිශ්චිත කාලයක් තුළ ව්‍යාපාරයට මුදල් ගලා ඒම්, ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගලා යාම් සහ නිශ්චිත කාලය අවසානයේ මුදල් ශේෂය දක්වයි.

### මුදල් ගලා ඒම්

ව්‍යාපාරයක මුදල් ගලා ඒම් ලෙස සටහන් කරන්නේ

- අයිතිකරුවන් යොදවන ප්‍රාග්ධනය
- ණය මුදල් ලබා ගැනීම
- විකුණුම් සඳහා මුදල් ලැබීම
- ණය ගැතියන්ගෙන් ලැබීම්
- ගොඩනැගිලි හෝ වෙනත් වත්කම් කුලියට දී ලබන ආදායම්
- ව්‍යාපාරයේ මුදල් ආයෝජනය කොට ලබන ආයෝජන ආදායම් හා පොලී ආදායම්

ආදී ලෙස කුමන ආකාරයෙන් හෝ ව්‍යාපාරය තුළට මුදල් ගලා ඒම් ය.

### මුදල් ගලා යාම්

ව්‍යාපාරයක මුදල් ගලා යාම් තීරණය වන්නේ එම ව්‍යාපාරයේ නිෂ්පාදන, අලෙවි, පරිපාලන සහ මූල්‍ය සැලසුම්වල අඩංගු කරන ලද වියදම් ඇස්තමේන්තුවලට අනුව ය. මේ අනුව ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගලා යාමට හේතුවන කරුණු කිහිපයක් පහත දැක්වේ.

- වත්කම් මිල දී ගැනීම
- අමුද්‍රව්‍ය හෝ වෙළෙඳ භාණ්ඩ තොග මිල දී ගැනීම
- විදුලිය, දුරකථන, රක්ෂණ, ප්‍රවාහන, බදු කුලී සේවක වැටුප් ගෙවීම ආදී වියදම් ගෙවීම
- ණය හිමියන්ට ගෙවීම
- ණය වාරික ගෙවීම හා ණය පොලිය ගෙවීම
- බදු මුදල් ගෙවීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## මුදල් ශේෂය

නිශ්චිත කාලච්ඡේදයක් තුළ ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් අතර වෙනස එම කාලච්ඡේදය අවසාන දිනට ඇති ශේෂය මුදල් ශේෂය ලෙස දැක්විය හැකි ය.




රූපය 5.3

ඉදිරි වර්ෂයක කාලය සඳහා ව්‍යාපාරයක ඇස්තමේන්තුගත මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් ලේඛනයක් පිළියෙල කර ඇති ආකාරය අධ්‍යයනය කරන්න.

**නිදසුන්** :-

පාසල් උපකරණ අලෙවි සැලක් ආරම්භ කිරීමට අපේක්ෂිත හාසිතගේ ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් ඉදිරි වර්ෂය සඳහා උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ව්‍යාපාරයට යොදවන හාසිතගේ මුදල් | 1 000 000 |
| අපේක්ෂිත අලෙවි ආදායම | 3 000 000 |
| බැංකු ණය ලබා ගැනීම | 500 000 |
| ගොඩනැගිලි කුලිය ගෙවීමට | 120 000 |
| විදුලි බිල සඳහා | 12 000 |
| ණය හිමියන්ට ගෙවීමට | 18 000 |
| සේවක වැටුප් ගෙවීමට | 300 000 |
| වෙළෙඳ තොග ලබා ගැනීමට | 2 300 000 |
| ණය වාරික හා පොලිය ගෙවීමට | 228 200 |
| වීදුරු අල්මාරි 08ක් මිල දී ගැනීමට | 300 000 |
| පොත් රාක්ක සැකසීමට | 250 000 |
| කාර්යාල උපකරණ මිලට ගැනීමට | 60 000 |
| මෙහෙයුම් පෙර වියදම් දැරීමට | 48 000 |
| ණය ගැතියන්ගෙන් ලැබීම | 100 000 |

භාසිතගේ ව්‍යාපාරය
පළමු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | රුපියල් | රුපියල් |
|---|---|---|
| මුදල් ගලා ඒම් | | |
| අයිතිකරුගේ යෙදවීම | 1 000 000 | |
| බැංකු ණය ලබා ගැනීම | 500 000 | |
| අපේක්ෂිත අලෙවි ආදායම | 3 000 000 | |
| ණය ගැතියන්ගෙන් | 100 000 | |
| මුළු මුදල් ගලා ඒම් | | 4 600 000 |
| මුදල් ගලා යාම් | | |
| ගොඩනැගිලි කුලිය ගෙවීම | 120 000 | |
| විදුලි බිල ගෙවීම | 12 000 | |
| ණය හිමියන්ට ගෙවීම | 18 000 | |
| සේවක වැටුප් ගෙවීම | 300 000 | |
| වෙළෙඳ තොග ලබා ගැනීම | 2 300 000 | |
| ණය වාරික හා පොලිය ගෙවීම | 228 200 | |
| වීදුරු අල්මාරි 08ක් මිල දී ගැනීම | 300 000 | |
| පොත් රාක්ක සැකසීම | 250 000 | |
| කාර්යාල උපකරණ මිලට ගැනීම | 60 000 | |
| මෙහෙයුම් පෙර වියදම් | 48 000 | |
| මුළු මුදල් ගලා යාම් | | 3 636 200 |
| කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය | | 963 800 |

***ක්‍රියාකාරකම 03***

පහත දැක්වෙන්නේ රෝෂිතගේ ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් ඉදිරි වර්ෂය සඳහා උපුටා ගත් තොරතුරු වේ. ඒ ඇසුරින් ඇස්තමේන්තුගත මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් පිළිබඳ ලේඛනය සකස් කරන්න. වර්ෂය අවසානයේ දී මුදල් ශේෂය පෙන්වා දෙන්න.

| විස්තරය | වටිනාකම රු. |
|---|---|
| අයිතිකරු ව්‍යාපාරයට යොදවන මුදල් | 500 000 |
| බැංකු ණය | 250 000 |
| විකුණුම් ආදායම් | 1 860 000 |
| උපකරණ මිලට ගැනීම | 120 000 |
| මේස හා පුටු මිල දී ගැනීම | 300 000 |
| පරිසරය අලංකාර කිරීමේ වියදම් | 60 000 |
| ව්‍යාපාර සැලැස්ම සැකසීමේ වියදම් | 5 000 |
| විකිණීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම | 1 100 000 |
| විදුලි බිල් ගෙවීම සඳහා | 20 000 |
| ජල බිල් ගෙවීම සඳහා | 25 000 |
| ණය වාරික ගෙවීමට | 55 000 |
| ලියාපදිංචි ගාස්තු | 1 500 |

## 5.5 ව්‍යාපාර ප්‍රතිඵල ගණනය

ව්‍යාපාරිකයෙකු යම් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමෙන් බලාපොරොත්තු වන්නේ ලාභයක් ලැබීමයි. යම් ව්‍යාපාරයක් නිශ්චිත කාලයක් අවසානයේ අත්පත් කර ගන්නා ලාභය වර්තමානයේ දැන ගැනීමට නම් අපේක්ෂිත ආදායම් හා වියදම් සැලකිල්ලට ගෙන අවසන් ලාභය පුරෝකථනය කළ යුතු වේ.

ව්‍යාපාර සැලැස්මක ප්‍රධාන අංගයක් වන මූල්‍ය සැලැස්මෙහි ඇතුළත් කරන ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රකාශය ව්‍යාපාරිකයාගේ එම අවශ්‍යතාව සපුරා දේ.

මෙම ලේඛනයෙහි මූලික වශයෙන් පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ.

- ඇස්තමේන්තුගත මුළු ආදායම
- ඇස්තමේන්තුගත මුළු වියදම
- අපේක්ෂිත ප්‍රතිඵලය


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

### ඇස්තමේන්තුගත මුළු ආදායම

අදාළ නිශ්චිත කාලය තුළ ව්‍යාපාරය අලෙවි කරන භාණ්ඩ හෝ සේවාවල මුළු වටිනාකම ඇස්තමේන්තුගත විකුණුම් ආදයම වේ. එහි දී අත්පිට මුදලට මෙන්ම ණය පදනමට කළ විකුණුම් ද සැලකිල්ලට ගත යුතු වේ. එමෙන්ම ව්‍යාපාරයක් විසින් ඉපැයීමට අපේක්ෂිත වෙනත් ආදයම් ද ඇත්නම් ඒවා ද සඳහන් කළ යුතු ය. මේ අනුව ඇස්තමේන්තුගත මුළු ආදායම යනු යම් කාලච්ඡේදයක් තුළ ඉපැයීමට අපේක්ෂිත විකුණුම් ආදායම සහ අනෙකුත් අපේක්ෂිත ආදායම්වල එකතුව වේ.

### ඇස්තමේන්තුගත මුළු වියදම්

අදළ නිශ්චිත කාලය තුළ අලෙවි කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් දැරීමට සිදුවන සියලුම පිරිවැය ඇස්තමේන්තුගත මුළු වියදම නම් වේ. මෙම වියදම ගණනය කිරීමේ දී නිෂ්පාදන පිරිවැය හා නිෂ්පාදන නොවන පිරිවැය වශයෙන් වෙන වෙන ම දක්විය යුතු ය.

#### නිෂ්පාදන පිරිවැය

ව්‍යාපාරයේ නිෂ්පාදන කටයුතුවලට සෘජු ව දායක වන්නා වූ වියදම් මේ යටතට ගැනේ. නිෂ්පාදන පිරිවැය ගණනයේ දී පහත දක්වෙන වියදම් පිළිබඳ ව සලකා බැලිය යුතු ය.

- අමුද්‍රව්‍ය පිරිවැය
- ශ්‍රම පිරිවැය
- වෙනත් පිරිවැය (පොදු කාර්යය පිරිවැය)

#### නිෂ්පාදන නොවන පිරිවැය

ව්‍යාපාරයේ නිෂ්පාදන කටයුතුවලට සෘජු ව දායක නොවන්නා වූ වියදම් මේ යටතට ගැනේ. ඒවා නම්,

- අලෙවි සැලැස්මේ අඩංගු විකිණීමේ හා බෙද හැරීමේ වියදම්
- පරිපාලන සැලසුමේ අඩංගුවන පරිපාලන වියදම්
- මූල්‍ය සැලැස්මේ ඇතුළත් වන මූල්‍ය වියදම් (ණය පොලිය ආදිය)

### අපේක්ෂිත ප්‍රතිඵලය

ව්‍යාපාරයේ අපේක්ෂිත මුළු ආදායමින් ඇස්තමේන්තුගත මුළු වියදම්වල එකතුව අඩු කළ විට ව්‍යාපාරයේ අපේක්ෂිත ප්‍රතිඵලය ලැබේ. එය ලාභයක් හෝ අලාභයක් විය හැකි ය. ප්‍රතිඵලය ලාභයක් වන්නේ නම් සහ එය යොදවන මුදලට ප්‍රමාණවත් යැයි ආයෝජකයා තෘප්තිමත් වන්නේ නම් ව්‍යාපාරය ආරම්භ කිරීමට තීරණය කළ හැකි වේ.




රූපය 5.4

ප්‍රතිඵලය අලාභයක් වූයේ නම් අලාභ ලබන එවැනි අවස්ථාවක ඒ සඳහා තීරණයක් ගැනීමට ව්‍යවසායකයාට මග පෙන්වීමක් ලබා දේ.

ඉදිරි වර්ෂයක කාලය සඳහා ව්‍යාපාරයක අවසන් ප්‍රතිඵලය ගණනය කිරීමේ ලේඛනයක් පිළියෙල කර ඇති ආකාරය අධ්‍යයනය කරන්න.

**නිදසුන් :-**

පහත දැක්වෙන ''සිරිසර රසකැවිලි'' ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මේ අඩංගු තොරතුරු ඇසුරින් එහි පළමු වර්ෂය සඳහා අවසන් ප්‍රතිඵලය ගණනය කරමු.

| **අයිතමය** | **වටිනාකම රු.** |
|---|---|
| විකුණුම් ආදායම | 3 000 000 |
| අමු ද්‍රව්‍ය පිරිවැය | 1 500 000 |
| ශ්‍රම පිරිවැය | 300 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 285 000 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 60 000 |
| පරිපාලන වියදම් | 72 000 |
| මූල්‍ය වියදම් (ණය පොලිය) | 24 000 |

''සිරිසර රසකැවිලි'' ව්‍යාපාරය
පළමු වර්ෂය සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් ආදායම | | 3 000 000 |
| **අඩු කළා -මුළු නිෂ්පාදන පිරිවැය** | | |
| අමුද්‍රව්‍ය පිරිවැය | 1 500 000 | |
| ශ්‍රම පිරිවැය | 300 000 | |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 285 000 | (2 085 000) |
| **අඩු කළා - මුළු නිෂ්පාදන නොවන පිරිවැය** | | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම | 60 000 | |
| පරිපාලන වියදම් | 72 000 | |
| මූල්‍ය වියදම් | 24 000 | (156 000) |
| ශුද්ධ ලාභය | | 759 000 |

මේ අනුව ''සිරිසර රසකැවිලි'' ව්‍යාපාරිකයා පළමු වසර තුළ ව්‍යාපාරික කටයුතුවලින් රුපියල් 759 000ක ශුද්ධ ලාභයක් ඉපැයීමට අපේක්ෂිත ය.



## ක්‍රියාකාරකම 04

පහතින් දැක්වෙන්නේ විසිතුරු පැළ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් කටයුතු කරන අමල් ප්‍රනාන්දුගේ 'විසිතුරු පැළ තවාන' වෙනුවෙන් සැකසූ ව්‍යාපාර සැලැස්මෙන් උපුටා ගත් තොරතුරු වේ. එම තොරතුරු ඇසුරින් පළමු වර්ෂය සඳහා අමල් ප්‍රනාන්දුගේ ව්‍යාපාරයේ අපේක්ෂිත ප්‍රතිඵලය ගණනය කරන්න.

| අයිතමය | වටිනාකම රු. |
|---|---|
| අපේක්ෂිත විකුණුම් අදායම | 1 800 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 320 000 |
| ශ්‍රම පිරිවැය | 360 000 |
| වෙනත් නිෂ්පාදන වියදම් | 220 000 |
| අලෙවි වියදම් | 48 000 |
| පරිපාලන වියදම් | 36 000 |
| මූල්‍ය වියදම් | 24 000 |



නොමිලේ බෙද හැරීම සඳහා ය.

## සමස්ත ව්‍යාපාර සැලැස්ම

මේ වන විට ඔබ අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම, පරිපාලන සැලැස්ම, මූල්‍ය සැලැස්ම යනාදී ව්‍යාපාර සැලසුමක මූලිකාංග පිළිබඳ ව හොඳින් අධ්‍යයනය කරන්නට ඇතැයි සිතමු. එම සැලසුම්වල දත්ත භාවිත කරමින් ව්‍යාපාරයක් විසින් සමස්ත ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කරනු ලැබේ.

**පහත දැක්වෙන විස්තරය මගින් සරල කරන ලද ආකෘතියකට අනුව ව්‍යාපාරයක සමස්ත ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කරන ආකාරය අධ්‍යයනය කරන්න.**

*උදුරා ලෙදර් ප්‍රඩක්ට්ස්*

*අනුරාධපුර සඳළිය ප්‍රදේශයේ පදිංචි උදුරා මධුවන්ති පාසල්වල වර්ණ හා නිල ලාංඡන සහිත ව ඒ ඒ පාසලට අනන්‍ය වූ පසුම්බි නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කළා ය.*

*පළමුවෙන්ම ඇය තමා ජීවත් වන ප්‍රදේශය ඉලක්ක කොට නිෂ්පාදන කටයුතු ඇරඹීමට තීරණය කළා ය. ඇය කරන ලද වෙළෙඳපළ අධ්‍යයනයෙන් අනාවරණය වූයේ එම ප්‍රදේශය තුළ 60 000කට ආසන්න ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින බවත් ඉන් 50%ක් ආසන්න වශයෙන් ශිෂ්‍යාවන් වන බවත් ය. සෑම ශිෂ්‍යාවක්ම වර්ෂයකට වරක් පසුම්බියක් මිල දී ගන්නා බව ද අනාවරණය කර ගන්නා ලදී.*

*පාසල් උපකරණ අලෙවිකරුවන් රු. 100 සිට 200 දක්වා තරගකාරී මිලගණන්වලට විවිධ වර්ගයේ පසුම්බි අලෙවි කරන බව ද අනාවරණය විය. ළමුන්ගේ සිත් ඇද ගැනීමට විවිධ වර්ගවල රූප සහිත ස්ටිකර් අලවා ඇති පසුම්බි වෙළෙඳුන් විසින් ඉදිරිපත් කොට තිබුණි.*

*තරගකරුවන් පිළිබඳ විස්තර මෙසේ ය.*

| තරගකරුවන් | නිෂ්පාදිතය | වෙළෙඳපළ කොටස |
|---|---|---|
| මල්කි පාසල් උපකරණ | පසුම්බි | 60% |
| සිසිර පාසල් උපකරණ | පසුම්බි | 40% |

*පසුම්බියක් සඳහා වන ඇස්තමේන්තුගත අමු ද්‍රව්‍ය වියදම් පහත පරිදි විය.*

| | රු. |
|---|---|
| කෘතිම සම් සඳහා | 25 |
| අනෙකුත් උපාංග සඳහා | 7 |
| ලාංඡන මැසීමට | 20 |
| | 52 |

පසුම්බිවල පතරොම් කැපීම සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වසර 5ක වැඩ පළපුරුද්ද ඇති තරුණියක් බඳවා ගැනීමට තීරණය කළ අතර ඇය වැඩ මූලික තනතුරේ තැබීමට ද තීරණය කළා ය. ඇයගේ මාසික වැටුප රු. 20 000කි. නිෂ්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය ඇයට පැවරේ.

මාසික ව රු. 15 000ක වැටුපකට අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් මාස 06ක වැඩ පළපුරුද්ද ඇති මහන යන්ත්‍ර ක්‍රියාකරවන්නියන් දෙදෙනෙකු බඳවා ගැනීමට ද අපේක්ෂිත ය.

ඇණවුම් ලබා ගැනීම, අලෙවි කටයුතු හා කළමනාකරණ කටයුතු උදාරා විසින්ම කරගෙන යාමට අදහස් කරයි. ඒ වෙනුවෙන් මාසික ව රු. 25 000ක මාසික වැටුපක් ලබා ගැනීමට ඇය අපේක්ෂා කරයි.

අපේක්ෂිත සෙසු මාසික වියදම් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| කම්හල් විදුලිය | 2 500 |
| දුරකථන වියදම් | 1 200 |
| ප්‍රවාහන වියදම් | 5 000 |

අමු ද්‍රව්‍ය ගෙන ඒමටත්, නිෂ්පාදිත බෙදා හැරීමටත් රු. 360 000ක් වටිනා ත්‍රී රෝද රථයක් මිලට ගත යුතු අතර එහි අපේක්ෂිත ජීවිත කාලය වසර 10කි. පසුම්බි මැසීම සඳහා එකක් රු. 60 000ක් වටිනා මහන මැෂින් 02ක් මිලට ගන්නා අතර ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය අවුරුදු 05ක් යැයි ඇස්තමේන්තු කරන ලදි.

රු. 1 000 000ක් වටිනා තමා නමට ඇති ගොඩනැගිල්ල නිෂ්පාදන ස්ථානය ලෙස භාවිත කිරීමට යෝජිත ය. මෙම ගොඩනැගිල්ල වාර්ෂිකව 12% බැගින් ක්ෂය කිරීමට අදහස් කරයි. 10% වාර්ෂික පොලියට ව්‍යවසායකත්ව සංවර්ධන බැංකුවෙන් රු. 500 000ක ණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ආපසු ගෙවීමේ කාලය අවුරුදු 05කි. පළමු වර්ෂය සඳහා ගෙවිය යුතු ණය වාරිකය රු. 120 000කි.

ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර පහත සඳහන් වියදම් දැරීමට අපේක්ෂිත ය.

| | රු. |
|---|---|
| ලියාපදිංචි ගාස්තුව | 1 200 |
| විදුලිය ලබාදීම සඳහා | 7 000 |
| ආරම්භක දින වියදම් | 5 000 |

දෛනික ව්‍යාපාර කටයුතු කරගෙන යාමට පවත්වා ගතයුතු මුදල රු. 75 000ක් බව තක්සේරු කොට ඇත.

පාසල් අලෙවිසල් හරහා නිෂ්පාදිත විකිණීමට ඉදිරිපත් කරන අතර පසුම්බියක් අලෙවිසැල් වෙත නිකුත් කරන මිල රු. 170ක් වේ. පළමු වර්ෂය තුළ ශිෂ්‍යාවන්ගෙන් 50%කට පසුම්බි අලෙවි කිරීමට හැකි වේ යැයි අපේක්ෂිත ය.

# ව්‍යාපාර සැලැස්ම

## 1. විධායක සාරාංශය

1.1 ව්‍යාපාරයේ නම, කර්මාන්ත ක්ෂේත්‍රය :-

1.2 අලෙවිකරණ සැලසුමේ ඉතාම වැදගත් කරුණු :-

1.3 නිෂ්පාදන සැලසුමේ ඉතාම වැදගත් කරුණු :-

1.4 පරිපාලන සැලසුමේ ඉතාම වැදගත් කරුණු :-

1.5 මූල්‍ය සැලසුමේ ඉතාම වැදගත් කරුණු :-

1.6 ව්‍යාපාරයේ සුවිශේෂීභාවය :-

1.7 ව්‍යාපාර සැලසුම සකස් කර ඉදිරිපත් කිරීමේ පරමාර්ථ හා අරමුණු :-

## 2. අලෙවි සැලැස්ම

2.1 නිෂ්පාදිතය

2.2 ඉලක්ක අලෙවි කණ්ඩායම

2.3 ඉලක්ක අලෙවි ප්‍රදේශය

2.4 අපේක්ෂිත භාණ්ඩය සම්බන්ධ වෙළෙඳපළ

| භාණ්ඩය | ඉලක්ක පාරිභෝගික සංඛ්‍යාව | පරිභෝජන රටාව | මාසික ඉල්ලුම | | වාර්ෂික ඉල්ලුම | |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රමාණය | වටිනාකම රු. | ප්‍රමාණය | වටිනාකම රු. |
| | | | | | | |



නොමිලේ බෙද හැරීම සඳහා ය.

2.5 තරගකරුවන්ගේ සැපයුම් විශ්ලේෂණය

| ප්‍රධාන තරගකරුවන් | සපයනු ලබන භාණ්ඩ හා සේවා | දළ වශයෙන් ඔවුනට ඇති වෙළෙඳපළ කොටස් |
|---|---|---|
| | | |

2.6 තම ඉලක්ක වෙළෙඳපළ කොටස

| භාණ්ඩය/සේවාව | පවතින වෙළෙඳපළ කොටස් ප්‍රමාණය | සැලසුම්ගත වෙළෙඳපළ කොටස |
|---|---|---|
| | | |

2.7 තරගකරුවන්ගේ අලෙවි උපාය මාර්ග

| අලෙවිකරණ මිශ්‍රය | උපාය මාර්ග |
|---|---|
| නිෂ්පාදිතය - Product | |
| මිල - Price | |
| ස්ථානය - Place | |
| ප්‍රවර්ධනය - Promotion | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

2.8 ව්‍යාපාරිකයාගේ යෝජිත අලෙවිකරණ උපායමාර්ග

| අලෙවිකරණ ශ්‍රිතය | උපාය මාර්ග |
|---|---|
| නිෂ්පාදිතය - Product | |
| මිල - Price | |
| ස්ථානය - Place | |
| ප්‍රවර්ධනය - Promotion | |

2.9 වාර්ෂික විකුණුම් පුරෝකථනය

| භාණ්ඩය | මසකට විකිණීමට අපේක්ෂිත ප්‍රමාණය | ඒකක මිල රු. | සාමාන්‍ය මාසික විකුණුම් වටිනාකම රු. | වාර්ෂික විකුණුම් වටිනාකම රු. |
|---|---|---|---|---|
| | | | | |

2.10 අලෙවි වියදම්

| අයිතමය | සාමාන්‍ය මාසික විකුණුම් වියදම රු. | වාර්ෂික විකුණුම් වියදම රු. |
|---|---|---|
| | | |

2.11 අලෙවි ස්ථාවර වියදම්

| අයිතමය | වටිනාකම රු. | වාර්ෂික ක්ෂය රු. |
|---|---|---|
| | | 1 වසර |
| | | |

## 03. නිෂ්පාදන සැලැස්ම.

3.1 නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම

| අයිතමය | මාසික අවශ්‍යතාව | ඒකක මිල රු. | මුළු වියදම රු. |
|---|---|---|---|
| | | | |
| මුළු නිෂ්පාදන පිරිවැය | | | |
| ඒකක පිරිවැය | | | |

3.2 නිෂ්පාදන ස්ථාවර වත්කම්

| අයිතමය | වටිනාකම රු. | වාර්ෂික ක්ෂය රු. |
|---|---|---|
| | | 1 වසර |
| | | |

## 04. පරිපාලන සැලැස්ම

4.1 ව්‍යවසායකයන් පිළිබඳ විස්තර

ව්‍යවසායකයාගේ නම :- ..............................................................

ලිපිනය :- ..............................................................

සුදුසුකම් :- ..............................................................

4.2 සංවිධාන ව්‍යුහය

සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්

| තනතුර | කාර්යය | වගකීම් | සුදුසුකම් |
|---|---|---|---|
| | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

4.3 පරිපාලන වියදම්

| අයිතමය | වියදම (මාසික) රු. | වියදම (වාර්ෂික) රු. |
|---|---|---|
| | | |

4.4 පරිපාලන ස්ථාවර වත්කම්

| අයිතමය | වටිනාකම රු. | වාර්ෂික ක්ෂය රු. |
|---|---|---|
| | | 1 වසර |
| | | |

## 05. මූල්‍ය සැලැස්ම

5.1 ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර කාර්යයන් හා වියදම්

| ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර කාර්යයන් | වියදම රු. |
|---|---|
| | |

5.2 මුළු ආයෝජන ඇස්තමේන්තුව

| | යෝජිත ආයෝජන | | මුළු ආයෝජන රු. |
|---|---|---|---|
| | අයිතිකරු යොදවන රු. | බැංකු ණය රු. | |
| ස්ථාවර වත්කම් | | | |
| මුළු ස්ථාවර වත්කම් (A) | | | |
| ආරම්භ කිරීමට පෙර වියදම් | | | |
| මුළු ආරම්භ කිරීමට පෙර වියදම් (B) | | | |
| කාරක ප්‍රාග්ධනය | | | |
| මුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව (C) | | | |
| මුළු ආයෝජනය (A+B +C) | | | |

5.3 ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | රු. | රු. |
|---|---|---|
| මුදල් ගලා ඒම<br><br>අඩු කළා - මුදල් ගලා යාම් | | |
| කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය | | |

5.4 අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් ආදයම<br>අඩු කළා - මුළු නිෂ්පාදන පිරිවැය<br><br><br>අඩු කළා - මුළු නිෂ්පාදන නොවන පිරිවැය | | |
| ශුද්ධ ලාභය | | |

## පිළිතුරු ලියමු.

01. මූල්‍ය සැලැස්ම යනු කුමක්ද?

02. ව්‍යාපාර ආරම්භ කිරීමට පෙර දැරිය යුතු වියදම් දක්වන්න.



03. ආයෝජන ඇස්තමේන්තුවක ඇතුළත් වන කරුණු දක්වන්න.

04. ව්‍යාපාරයකට මුදල් ගලා ඒමේ සහ ගලා යාමේ මාර්ග කවරේද?

05. ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක ඇතුළත් වන කරුණු මොනවාද?



නොමිලේ බෙද හැරීම සඳහා ය.